සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## පළමු වාර පරීක්ෂණය 2015

# නාට්‍ය හා රංග කලාව

**9 ශ්‍රේණිය** **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකය: |
|---|

## I කොටස

- දී ඇති උපදෙස් අනුව සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 කදාවළලු නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ

(1) දයානන්ද ගුණවර්ධන (2) එදිරිවීර සරච්චන්ද්‍ර
(3) ආර්. ආර්. සමරකෝන් (4) බන්දුල ගුණවර්ධන

02 මුල්වරට කදාවළලු නාට්‍ය රඟදක්වන ලද්දේ

(1) 1958 (2) 1946 (3) 1952 (4) 1960

03 කදාවළලු නාට්‍ය නිර්මාණය කිරීමට යොදාගත් ජාතක කතාව වන්නේ,

(1) චුල්ල දනුද්ධර (2) මහා පදුම (3) සේරිවාණිජ (4) කුස

04 කදාවළලු නාට්‍යයේ කච්චපුටගේ චරිතය අයත්වන්නේ,

(1) යහපත් වෙළෙන්දාගේ චරිතයට (2) අයහපත් වෙළෙන්දාගේ චරිතයය
(3) මිත්තනියගේ චරිතයට (4) තොටියාගේ චරිතයට

05 ප්‍රධාන නාට්‍ය ශෛලීන් ගණන වන්නේ,

(1) 4 කි. (2) 5 කි. (3) 3 කි. (4) 2 කි.

06 කදාවළලු නාට්‍ය අයත් ශෛලිය වන්නේ,

(1) ලෝධ ධර්මී (2) නාට්‍ය ධර්මී (3) මිශ්‍ර ශෛලීය (4) ශෛලිගත

07 නාට්‍ය ගීත හා ගීතමය දෙබස් ඇතුළත් නාට්‍ය ශෛලිය වන්නේ,

(1) ලෝධ ධර්මී (2) ස්වාභාවික (3) නාට්‍ය ධර්මී (4) තාත්වික

08 කදාවළලු නාට්‍යයේ රන් තලිය අයත් වන්නේ,

(1) රංග භාණ්ඩවලට (2) රංග ආභරණවලට
(3) රංග වස්ත්‍රවලට (4) අංගරචනයටය

09 අනුෂාංගික කලා අංග ලෙස හඳුන්වන්නේ,

(1) නාට්‍යයට පිටතින් එකතුවන කලා අංග
(2) නාට්‍ය සංගීතයට පමණි.
(3) නාට්‍යයේ අංග රචනයට පමණි.
(4) නාට්‍ය පිටපතට පමණි.

10 වේෂ භූෂණයට මින් අයත් නොවන්නේ,

(1) රංග වස්ත්‍රාභරණ (2) අංග රචනය
(3) නාට්‍යෝපකරණ (4) දෙබස්

11 නාට්‍යයක අභිනය ගණන වන්නේ,

(1) 5 කි. (2) 4 කි. (3) 3 කි. (4) 2 කි.

12 නාට්‍ය සන්දර්භය තුළ චරිතයක දැකිය හැකි විවිධ පැතිකඩ හැඳින්වීම සඳහා යොදාගන්නා නමකි

(1) භූමිකාව (2) අභිරූපනය
(3) චරිත නිරූපන (4) අනුෂාංගික කලා අංග

13 චරිත නිරූපනයේ දී අවශ්‍ය නොවන අංගයකි

(1) ස්මරණ ශක්තිය (2) රංග අභ්‍යාසයන්හි පුහුණුව

(3) පරිකල්පන ශක්තිය (4) නාට්‍ය පිටපත් රචනය

14 මින් අනුෂාංගික කලා අංගවලට අයත් නොවේ.

(1) වේෂ භූෂණය (2) අංග රචනය (3) රංග ආලෝකය (4) නාට්‍ය පිටපත

15 නාට්‍යයක අර්ථපති යනුවෙන් හඳුන්වන්නේ,

(1) වේදිකා පාලක (2) මුදල් වැයකරන්නා

(3) නාට්‍ය අධ්‍යක්ෂක (4) පෙළ මතක්කරන්නන්

16 නළුවන් වෙනත් චරිතයකට ප්‍රවේශ වීම හඳුන්වන්නේ,

(1) සමාරෝපය (2) අනුරූපනය (3) අනුකරණය (4) අභිරූපනය

17 සමාරෝපය බෙදෙන ප්‍රධාන කොටස් ගණන වන්නේ,

(1) 4 කි. (2) 5 කි. (3) 3 කි. (4) 2 කි.

18 චරිතයකට අවශ්‍ය පරිදි කටහඬ හා ශරීරාංග යොදාගෙන අභිනය පෑම අයත්වන්නේ,

(1) අභ්‍යන්තර සමාරෝපයයි. (2) බාහිර සමාරෝපයයි.

(3) අංග රචනයයි. (4) මේ කිසිවක් නොවේ.

19 සමාරෝපය හඳුන්වන වෙනත් නමක් නොවන්නේ,

(1) ආරූඪ වීම (2) අනුකරණය (3) ආවේශ වීම (4) වෙස් වලා ගැනීම

20 මනමේ නාට්‍ය නිෂ්පාදනය කරන ලද්දේ,

(1) දයානන්ද ගුණවර්ධන (2) සුගතපාල ද සිල්වා

(3) එදිරිවීර සරච්චන්ද්‍ර (4) බන්දුල ජයවර්ධන

(2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 20 කි.**

01 ''හොඳයි අද උදේ ඉස්සෙල්ලාම හන්දා කහවණු අටක් දෙන්ඩ. ඕකෙ නියම මිල නම් කහවණු දොළහයි.''

(1) ඉහත දෙබස අයත් නාට්‍ය කුමක් ද?

(2) එහි නාට්‍ය අධ්‍යක්ෂක කවුද?

(3) මෙම දෙබස කවුරුන් විසින් කා සඳහා කියන ලද්දක්ද?

(4) මෙම නාට්‍යයේ එන වෙනත් චරිත 02 ක් නම් කරන්න.

(5) මෙම නාට්‍යයෙන් අපට දෙන ආදර්ශය ලියන්න. (ල. 10)

02 (1) නාට්‍ය ප්‍රධානව බෙදෙන ශෛලීන් ගණන කීයද?

(2) ඒවා නම් කරන්න.

(3) එයට උදාහරණ දෙක බැගින් ලියන්න. (ල. 10)

03 (1) අභිනය යනු කුමක් ද?

(2) අභිනය බෙදෙන ප්‍රධාන කොටස් කීයද? ඒ මොනවාද?

(3) අභිනයේ කොටස් කෙටියෙන් විස්තර කරන්න. (ල. 10)

04 (1) නාට්‍ය නිර්මාණය සඳහා නාට්‍ය අධ්‍යක්ෂකට සහාය වන අනෙකුත් ශිල්පීන් දෙදෙනෙක් නම් කරන්න.

(2) සමාජය තුළ දකින එක් භූමිකාවක් ගෙන එහි ඇති වෙනත් පැතිකඩ (භූමිකා) රූප සටහනක් (ප්‍රස්තාරයක්) මගින් පෙන්වන්න.